මගේ අංකය / எனது இல. / My No. RG/MBD/ 11 | චක්‍රලේඛ.

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊ-මේල් / மின்னஞ்சல் / Email: info@rgd.gov.lk, rg@rgd.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.rgd.gov.lk

චක්‍රලේඛ අංක: 07/2019

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.

234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date: 2019.02.26

සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

සියලුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්

## විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ විදේශ ලිපිනය සඳහන් කර විවාහ ලේඛන ලියාපදිංචි කිරීම.

විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ විවාහ වීමට අදහස් කර සිටින පාර්ශවයන් දෙදෙනාගෙන් අයෙක් එකී පනතේ 23 වන වගන්තිය යටතේ ලබාදිය යුතු දැනුම්දීමට කලින් වූ ඒ ලඟම දින 10 ක් දිවයිනේ පදිංචිව නොසිටින අවස්ථාවක දී සහ අනෙක් පාර්ශවය ඒ ලඟම දින 10 ක් දිවයිනේ පදිංචිව සිටින අවස්ථාවක දී එසේ දින 10 ක් දිවයිනේ පදිංචිව සිටින පාර්ශවය විසින් තමන් දින 10 ක් පදිංචිව සිටි ප්‍රදේශයේ රෙජිස්ට්‍රාර් වෙතට විවාහ දැනුම්දීම සිදු කළ හැකි බව එකී පනතේ 23 (3) වන වගන්තියේ ද විවාහ වීමට අදහස් කර සිටින පාර්ශවයන් දෙදෙනාම එකී පනතේ 23 වන වගන්තිය යටතේ ලබාදිය යුතු දැනුම් දීමට කලින් වූ ඒ ලඟම දින 10 ක් දිවයිනේ පදිංචිව නොසිටින අවස්ථාවකදී සහ එක් පාර්ශවයක් ඒ ලඟම දින 4 කට වඩා අඩු නොවන කාලයක් දිවයිනේ පදිංචිව සිටින අවස්ථාවක දී එසේ දින 4 ක් දිවයිනේ පදිංචිව සිටින පාර්ශවය විසින් තමන් දින 4 ක් පදිංචිව සිටි ප්‍රදේශයේ රෙජිස්ට්‍රාර් වෙතට විවාහ දැනුම්දීම සිදුකළ හැකි බවට එකී පනතේ 23(4) වන වගන්තියේ දැක්වේ.

එසේම එකී 23 (3) හා 23(4) වන වගන්ති යටතේ කරනු ලබන දැනුම්දීමක් දිවයිනේ පදිංචිව නොසිටින පාර්ශවය වෙනුවෙන් ද පළ කරන ලද දැන්වීමක් ලෙසට සලකනු ලැබිය හැකි බව එකී පනතේ 23 (5) වන වගන්තියෙහි දක්වා ඇත.